# ධාරා

එච්.වී. දිනුදි තිවේන්‍යා ගුණවර්ධන



ග්‍රන්ථ නාමය :- ධාරා

කතාව හා චිත්‍ර :- එච්.වී. දිනුදි තිවේනායා ගුණවර්ධන

ISBN අංකය :- 978-624-206-798-8

මෙම කෘතියෙහි සියලුම අයිතිය කර්තෘ සතුය..

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.10.20

# <u>පිදුම</u>

මාගේ ලේඛන කුසලතාව වර්ධනය කර ගැනීම උදෙසා මඟ පෙන්වූ දයාබර මහාමායා විදුහලේ 4 C පන්තියේ ප්‍රියන්ති ජයසේකර ගුරු මෑණියන් ඇතුළු සියලුම ගුරු මව්-පියවරුන්ට සහ පොත සාර්ථකව නිර්මාණය කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් මා ආදරණීය දෙමව්පියන් ඇතුළු පවුලේ සියලු දෙනාටත්, සියලුම යහළු-යෙහෙළියන්ටත් මාගේ අත්දැකීම් ද ඇතුළත් කර සැකසූ මෙම පොත ගෞරවයෙන් පිළිගන්වමි .

එච්.වී. දිනුදි තිවේන්‍යා ගුණවර්ධන

4 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විදුහල , මහනුවර

# <u>ධාරා බය වූ කොටි ජැකැට්ටුව</u>

එක දවසක් ධාරා රෑ ඇහැරුණා. එතකොට ධාරා ට තිබහක් ආවා. ධාරා බිමට බැස්සා. ඊට පස්සේ ධාරා විදුලි පන්දම ගන්න ඇඳ යටට එබිලා බැලුවා.



එතකොට ධාරා කොටියෙක්ව දැක්කා. ධාරා ආයෙත් ඇඳට නැග්ගා. ධාරාට ගොඩාක් බය හිතුණා. ඉතින් ධාරා “අම්මේ..,අම්මේ..,අම්මේ...” කියලා කතා කලා. එතකොට ධාරාට දොරක් අරින සද්දයක් ඇහුණා. “හොරෙක්වත්ද දන්නෙ නෑ..”ධාරා හිතුවා. ඉතින් ධාරා බය වුණා. ධාරා ඇස් දෙක වහගත්තා. ධාරා ආයෙත් ඇස් දෙක ඇරියා.



එතකොට ධාරා අම්මාව දැක්කා. “ අම්මේ මං ගාවට එන්න එපා. මොකද මගේ ඇඳ අස්සේ කොටියෙක් ඉන්නවා. ඒකයි මම බයෙන් ඉන්නේ...”ධාරා කීවා. අම්මා ඒ ගැන කල්පනා කළා. ඉතින් අම්මා ඇඳ යට බැලුවා. අම්මාට හොඳටම හිනා ගියා. “අම්මේ..ඇයි හිනා වෙන්නේ..” කියලා ධාරා ඇහුවා. “පුතේ මේ තියෙන්නේ ඔයාගේ කොටි ජැකට් එකනේ..” අම්මා කිව්වා .



එතකොට ධාරා අම්මාගෙන් ප්‍රශ්ණයක් ඇහුවා. “අම්මේ.. මට දොරක් අරින සද්දයක් ඇහුණා. ඒ කවුද? ”. “ඒ මමනෙ පැටියෝ..” අම්මා කිව්වා. ධාරාටයි , අම්මාටයි හිනා ගියා. වතුර ටිකක් බී ධාරා , අම්මාට “සුබ රාත්‍රියක්..” කියා නින්දට ගියා.



# ආදරණීය පූස් පැටියා

එක නිවාඩු කාලයක ධාරා ආච්චි අම්මාගේ ගෙදර ගියා. එහිදී ධාරා කළු පූස් පැටියෙක්ව දැක්කා. එයා හරිම ලස්සනයි. ධාරා එයා ගාවට ගියා. ඌ බයවෙලා දිව්වා. ඒක දැකපු ධාරාගේ තාත්තා පූස් පැටියාව ආදරයෙන් වඩා ගත්තා.



ටික දවසක් ගියා. පූසා, ධාරාත් එක්ක සෙල්ලම් කරන්න පටන් ගත්තා. එයා ධාරා එක්ක යාළු වෙලා. නිවාඩු කාලය අවසන්ව ධාරා නැවත නුවර ගියා. ධාරාට පූස් පැටියාව මතක් වුණා.



කඨින පිංකම තිබුණු නිසා නැවත ධාරාට ආච්චි අම්මාගේ ගෙදර යෑමට ලැබුණා. පූස් පැටියාව බලන්නත් පුළුවන් ධාරාට හරි සතුටුයි. අනේ පූස් පැටියාව බල්ලො ටිකක් හපලා. පූසාගේ අතක් කැඩිලා නිසා බෙහෙත් දාලා තිබුණා. ධාරාට ගොඩාක් දුක හිතුණා. ධාරා පූසාට යෝගට් දුන්නා. පූසා කෑවා.



කඨින පිංකම නිසා ධාරා ඊළඟ දවසේ පාන්දර 2.00 ට අවදි වුණා.  නමුත් ධාරා පූස් පැටියාව දැක්කේ නැහැ. සුදු ඇඳුම් ඇඳගත් ධාරා ද කඨින චීවරය වඩම්මවමින් පෙරහැරෙන් පන්සලට ගියා. මල්ලී කරඬුව හිස මත තබාගෙන ගියා. අපි පන්සලේ වැඩ කටයුතු අවසන් කර ගෙදරට ආවා.



ගෙදරට ආපු නැන්දාට තාත්තා මෙහෙම කිව්වා. “බල්ලො ටිකක් අපේ පූස් පැටියාව හපලා, බඩ හිල් වෙලා තිබුණා”. “පූසා මැරෙන්න ඇති මොකද සමහර වෙලාවට පූසො එහෙම මැරෙනවා” නැන්දා කියනවා ධාරාට ඇසුණා. ධාරාට දුක හිතුණා. තාත්තාත් දුකින්. පූස් පැටියාව නැවත දකින්න ලැබේවායි පතමින් ධාරා නුවර යන්න පිටත්වුණා.



# <u>මා හිතවත් ගුරුවරුන්</u>

2020 නව වසර ලැබුවා. අම්මායි , තාත්තායි ධාරාව ඉගෙනීම සඳහා පාසලකට ඇතුළත් කරනු ලැබුවා. ඒ පාසල තමයි මහනුවර මහාමායා බාලිකා විදුහල.




පළමු දවසේ සෙල්ලම් ගෙවල් වල සෙල්ලම් කළහැටි ධාරාට තාම මතකයි. ධාරා ට එතනදි යෙහෙළියන් හමුවුණා.

කාලය ගතවුණා. ධාරා 11 වසර පංතියටත් ගියා. සාමාන්‍ය පෙළ විභාගය හොඳින් සමත් වුණා. උසස් පෙළ විභාගයත් හොඳින් සමත් වුණා. ධාරා බොහොම සතුටින් ඉගෙන ගත්තා. ධාරා ට සහතිකද බොහොමයක් ලැබුණා.



2033 වසරේ පාසලෙන් සමුගන්නා අවසන් දින කිහිපය ලැබුවා. ධාරා ගුරුවරුන්ට, යෙහෙළියන්ට සමුදීමට සූදානම් වුණා. ධාරා හරිම දුකින් පාසලෙන් සමුගත්තා.



ඒ වුණත් ධාරා ආයෙත් දවසක පාසල බලන්න ගියා. හැම පන්තියකම ගුරුවරුන්ගේ ආශීර්වාදය ලබාගත්තා. ඊළඟ භවයෙත් නැවත වරක් පාසල් එන්න ලැබුණොත් , මේ පාසලටම එන්න ලැබේවායි පතමින් මහාමායා මවුනි ඔබටත් සියලුම ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත් ස්තූති කරමින් ධාරා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ආරම්භ කළා.



## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මහපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු



මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20